# සංක්ෂිප්තය


චිත්‍ර කලාව විෂයය මගින් 6 ශ්‍රේණියේ සිසුන් තුළ නිර්මාපීබව වර්ධනය කිරීම සඳහා සිදු කරන ලද මෙම පර්යේෂණය සඳහා කාර්යමූල පර්යේෂණ පිරිසැලසුම තෝරා ගන්නා ලදි. මෙම පර්යේෂණය අරමුණු හයක් ඔස්සේ දිශා ගත කරන ලදී. එනම්, නිර්මාපීබවේ ගැටළු සහිත සිසුන් හඳුනා ගැනීම, එම සිසුන්ගේ නිර්මාපීබවේ ගැටළුවල ස්වභාවය හඳුනා ගැනීම, එම සිසුන්ගේ නිර්මාපීබවේ ගැටළුවලට නිවස ආශ්‍රිතව බලපාන සාධක හඳුනා ගැනීම, සිසුන්ගේ නිර්මාපීබව වර්ධනයට ප්‍රතිකාර්ය වැඩසටහනක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ප්‍රතිකාර්ය වැඩසටහනේ ඵලදායීතාවය පරීක්ෂා කිරීම, ප්‍රතිකාර්ය වැඩසටහන සංවර්ධනයට යෝජනා ඉදිරිපත් කිරීම ආදියයි.

පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත රැස් කර ගැනීමට සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් යන නියැදි කාණ්ඩ සාරම්මණ නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. සිසු නියැදිය පාසලේ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති දෙකක චිත්‍ර විෂයය හදාරණ සිසුන් අතරෙන් තෝරා ගන්නා ලදී. එසේම එම සිසුන්, සිසුන්ගේ දෙමාපියන් හා සිසුන් දෙදෙනාගේ පන්ති භාර ගුරු භවතුන්, ගණිතය හා සිංහල විෂයන් උගන්වන ගුරු භවතුන් නිෂ්සසම්භාවී නියැදිකරණ ක්‍රමයෙන් තෝරා ගන්නා ලදී.

සිසුන් සඳහා පවත්වන ලද අනාවරණ පරීක්ෂණයෙන් ප්‍රමාණාත්මක දත්ත ලබා ගත් අතර සිසුන් සඳහා පැවැත්වූ ආකල්පමාන පරීක්ෂණයෙන්, දෙමාපියන් හා ගුරුවරුන් සඳහා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලින් ගුණාත්මක දත්ත ලබා ගන්නා ලදී. ප්‍රතිකාර්ය වැඩසටහන අතරතුර දී නිරීක්ෂණ මෙන්ම සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කර ගන්නා ලදී. රැස් කර ගන්නා ලද දත්ත වගු හා ලිඛිත ප්‍රකාශන මගින් විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව පහත නිගමනයන්ට එළඹෙන ලදී. එනම් පන්ති කාමරය තුළ නිර්මාපීබවේ විවිධ මට්ටම් සහිත සිසුන් සිටින බව, නිර්මාපීබවින් අඩු සිසුන් අළුතින් යමක් නිර්මාණය කිරීමට පසුබට වන බව, නිර්මාපීබවින් අඩු සිසුන් තම අදහස පැහැදිලිව ඉදිරිපත් කිරීමට අපොහොසත් බව, නිර්මාපීබවින් අඩු සිසුන් ස්වාධීනව වැඩ කිරීමට කැමැත්තක් නොදක්වන බව, සංකීර්ණ සියුම් වැඩවලට නිර්මාපීබවින් අඩු සිසුන් අපොහොසත් වන බව, වැඩ පිළිබඳව නිතර ප්‍රශ්න ඇසමින් ඇරඹූ වැඩ නිම කිරීමට විශේෂ උනන්දුවක් නොදක්වන බව, සිසුන්ගේ මුල් ළමා වියේ දී දෙමාපිය අවධානය අඩු වීම නිර්මාපීබව වර්ධනය කෙරෙහි බලපා ඇති බව, සිසුන්ගේ මුල් ළමා වියේ දී දෙමාපිය අවධානය අඩු වීම නිර්මාපීබව වර්ධනය කෙරෙහි බලපා ඇති බව, සිසුන් තුළ නිර්මාපීබව වර්ධනය කිරීමේ දී චිත්‍ර කලාව විෂයයට සුවිශේෂී ස්ථානයක් හිමි වන බව, නිර්මාණශීලී ක්‍රියාවලියේ එක් සංවර්ධන අවස්ථාවක් මත එයට පසු සංවර්ධන අවස්ථාව රඳා පවතින බව, නිර්මාපීබව වර්ධනය කිරීමේදී ගැටළු විසඳීමේ ක්‍රමය වැදගත්වන බව, සිසුන් තුළ නිර්මාපීබව වර්ධනය කිරීමේ දී චිත්‍ර කලාව විෂයය ඉගැන්වීමේ සුවිශේෂී ක්‍රම භාවිත කිරීම වැදගත්වන බව, නිර්මාපීබව වර්ධනය කිරීමේදී ඉගැන්වීමේ මූල ධර්ම

භාවිත කිරීම වැදගත්වන බව, ප්‍රතිකාර්ය වැඩසටහනට පසුව සිසුන් තුළ වූ නිර්මාපීබවේ ගැටළු යම් දුරකට මඟ හැරුණු බව සහ ප්‍රතිකාර්ය වැඩසටහනට පසුව සිසුන් තුළ, තමා සතු නිර්මාපීබව පිළිබඳ ආකල්පවල ධනාත්මක සංවර්ධනයක් ඇති වී තිබෙන බව වශයෙනි.

අඛණ්ඩ ඇගයීම් ක්‍රමයක් ලෙස අවාචික නිර්මාපී පරීක්ෂණ භාවිත කිරීම, දිගු කාලීන නිරීක්ෂණ මගින් සිසුන්ගේ නිර්මාපීබවේ ගැටළුවල ස්වභාවය නිවැරදිව හඳුනා ගැනීම, විවිධ මාධ්‍ය හා ක්‍රම ශිල්ප මගින් නිර්මාණ කිරීමට අවස්ථාව සලසා දීම, නිර්මාණශීලී ලක්ෂණ සිසුන් තුළ ඇති බවට සිසුන් දිරි ගැන්වීම, වැඩ පිළිබඳව නිතර ප්‍රශ්න කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම, නිර්මාපීබව පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම, විෂය නිර්දේශ ආවරණය කිරීමට සීමා නොවී නිර්මාපීබව අවම දරුවන් තුළ නිර්මාපීබව විකසිත කිරීමට චිත්‍ර විෂයය යොදා ගැනීම, ප්‍රතිකාර්ය වැඩසටහනේ එක් එක් පියවරවලදී තව දුරටත් තම කුසලතා ඔප් නංවා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම, චිත්‍ර කලාව විෂයය ඉගැන්වීමේ සුවිශේෂී ක්‍රම වැඩි දියුණු කිරීම, ප්‍රතිකාර්ය වැඩසටහනේ ඵලදායීතාව සොයා බැලීම දෙමාපියන් හා සිසුන්ට උගන්වන ගුරුභවතුන්ගෙන් ද තොරතුරු ලබා ගැනීම ආදිය යෝජනා ලෙස ඉදිරිපත් කරන තිබේ.